3 වන පිටෙන්

**එලෙස නිතර නාය යෑම්වලට ලක්වන්නේ මේ ප්‍රදේශයේ භූ පිහිටීමේ විශේෂත්වයක් නිසාද?**

මේ ප්‍රදේශයේ භූ විෂමතා ලක්ෂණ සහ භූ විද්‍යාත්මක ලක්ෂණ සහ මානව ක්‍රියාකාරීත්වයන් දෙස බලන විට බෙරගල සිට කොස්වත්ත දෙසට ඒවා වැඩිවන ස්වභාවයක් දකින්න පුළුවන්. මේ නාය ගිය මීරියබැද්ද ප්‍රදේශය හා ඒ අවට ඇතැම් ස්ථාන අංශක 40 කටත් වඩා වැඩි බෑවුම් සහිත ප්‍රදේශ. මේ ප්‍රදේශයේ බෑවුමේ ස්වභාවය අංශක 25*30 සිට 60*70 දක්වා වෙනස් වෙමින් පැතිරී තිබෙනවා. අනිත් කාරණය මේ ප්‍රදේශය ශාඛීය ජලවහන රටාවක් සහිත ප්‍රදේශයක්. එනම් කුඩා අතු ගංගා සහ නිම්න සහිත ජලවහන රටාවක් සහිත ප්‍රදේශයක්.

**අංශක 40 ක් තරම් බෑවුම් සහිත මේ ප්‍රදේශය විශාල ලෙස කපල ලැයින් කාමර පේළි සහ පිට්ටනි ඉදිකර තිබෙනවා. මෙබඳු ඉදිකිරීම් මෙවැනි විශාල නාය යෑම්වලට හේතුවක් විය හැකිද?**

මා හිතන්නෙ එය තමයි මෙබඳු විපත් කැඳවා ගන්න අප විසින් සිදුකර ඇති දේ. එක්දහස් අටසිය ගණන්වලදී තේ වගාව මේ පළාත්වල ව්‍යාප්ත වෙද්දී බදුල්ල දිස්ත්‍රික්කයේම ජනගහනය ලක්ෂයකට මඳක් වැඩි ප්‍රමාණයකයි තිබුණේ. අද එය ලක්ෂ අටකට ආසන්න වී තිබෙනවා. එක්දහස් අටසිය ගණන්වල පහළොස් දහසක් පමණ සිටි වතුකරයේ ජනගහනය අද ලක්ෂ ගණනක් දක්වා වැඩිවී තිබෙනවා. වතු නිවාස පමණක් නොව පාසල් ආරෝග්‍ය ශාලා සහ ක්‍රීඩා පිටි ආදිය මේ කඳුකර ප්‍රදේශයේ අද ගොඩනැඟිල තිබෙනවා. තේ කර්මාන්ත ශාලා සහ ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් ඇතිවී තිබෙනවා. කඳුකර ප්‍රදේශයේ මේ සියල්ල ඉදිකර තිබෙන්නෙ බෑවුම් කපල.

දැඩි බෑවුමක් හැමවිටම එහි බෑවුම් ස්වරූපය රැක ගැනීමට උත්සාහ දරනවා. ඒ අනුව බෑවුමක කොටසක් කපා තැනි තලාවක් බවට පත් කළ පසු ඊට ඉහළින් ඇති පස් තට්ටුව හැම විටම උත්සාහ දරන්නේ ලිස්සා විත් එම තැනිතලාව වසා ගැනීමටයි. පිට්ටනියක් හැදුවත් ගෙපළක් කැපුවත් පාරක් හැදුවත් අවසාන ප්‍රතිඵලය ඕකයි.

ජනගහනය වැඩිවෙන්න වැඩිවෙන්න මේ බෑවුම් ප්‍රදේශවලත් ජනතාව පදිංචි වෙන්න පටන් අරගෙන තිබෙනවා. නොයෙක් ගොඩනැඟිලි ඉදිකිරීමටත් ඒවාට ජලය ලබාගැනීමට ජලනළ එළීමටත් මේ බෑවුම් ප්‍රදේශ විශාල වශයෙන් කපා හාරා තිබෙනවා. අද මේ තත්ත්වය මීරියබැද්දට පමණක් සීමාවෙලා නෑ. මධ්‍ය කඳුකරයේ වතු ආර්ථික ප්‍රදේශ පුරා අද මේ තත්ත්වය ව්‍යාප්ත වෙලා.

**මේ නාය යෑමත් සමග විශාල ජල කඳක් විනාශවුණු නිවාස අතරින් ගලා යනු අපි දුටුවා. නාය යෑමත් සමග කඳුමුඳුනින් විශාල ජලකඳක් මතුවුණේ කොහොමද?**

මේ නාය යෑම ආරම්භ වුණේ විශාල ශබ්දයකුත් සමග කියලයි එය ඇසූ දුටු අය කියන්නේ. මේ සිදුවීම හඳුන්වන්නේ දිය හෙනය කියල. මේ මීරියබැද්දේ සිදුවුණා වගේ දැවැන්ත නාය යෑම් සිදුවෙන්නේ කන්දක මතුපිට පස් තට්ටුව එහි මව් පාෂාණ තට්ටුව සමග ඇති සම්බන්ධය බිඳී යෑම නිසා මතුපිට පස් තට්ටුව ක්ෂණිකව පහතට ලිස්සා යෑමෙනුයි. කාලයක් තිස්සේ මව් පාෂාණ ස්ථරය හා මතුපිට පස් තට්ටුව අතරට ජලය එකතු වීමෙන් මව් පාෂාණය හා මතුපිට පස් තට්ටුව අතර ඇති සම්බන්ධය බිඳ වැටෙනවා. මේ පස් තට්ටු අතර එකතු වන ජලය ඇතැම්විට ලීටර් ලක්ෂ ගණනක් විය හැකියි. එසේ විශාල ජල ප්‍රමාණයක් එකතු වීමෙන් එක් අවස්ථාවක එය දරාගත නොහැකිව මතුපිට පස් තට්ටුවත් සමග විශාල ශබ්දයකුත් සමග පහළට ගලාගෙන එනවා. එය ආරම්භ වන්නේ පුපුරා යෑමක් හැටියටයි.

මීට ප්‍රථම නිකලඔය සිදු වූ නාය යෑමේදී මෙබඳු පිපිරීම් ශබ්දයක් සමග පස් හා ගල් විශාල ප්‍රමාණයක් පහළට රූටා ආවා. මෙවර නාය යෑමට කලින් මේ ප්‍රදේශයේම ලේමස්තොට ඔය ආසන්නයේ සිදු වූ නාය යෑමේදීත් මේ විදිහේ ශබ්දයක් ද සමග විශාල ජල කඳක් ගලා ගොස් තිබෙනවා. මේ විශාල ජල කඳත් සමග එන මහා පස් කන්ද හමුවන සියලූ දේ යටකරගෙන ඒවාත් රැගෙන කඳු පාමුල දක්වා ගමන් කරනවා. ඇතැම් විට ඒ රැගෙන එන සුන්බුන් මෙට්‍රික් ටොන් සිය ගණනක් විය හැකියි. නාය යෑමකදී ජලයත් සමග පහළට ලිස්සා එන මහා පස්කන්දටත් විශාල බලයක් තිබෙනවා. නාය යෑමක් කියන්නෙත් බෑවුමක් දිගේ විශාල පස් කන්දක් ගලා යෑමක්.



## කඳු

### මාලතී කල්පනා ඇම්බ්‍රෝස්

*"හල්දුම්මුල්ල, මීරියබැද්ද තේ වත්ත නාය ගොස් වතු කම්කරු ලැයිම් නිවාස සිය ගණනක් පස් යට වැලලිණ"*

කඳු අතර කඳු වගේ දුක් වින්ද
කඳු සදිසි මිනිසුන්ගෙ දුක් කන්ද
කොඳු නවා කඳු දැරූ මිනිසුනේ,
කඳු ශිඛර දිය වුනේ කඳුළින්ද?

boondi.lk



**මෙබඳු නාය යෑම්, සුනාමි ඇතිවීම්, ගංවතුර වැනි දේ ස්වාභාවික විපත් ලෙසයි සැලකෙන්නේ. සොබා දහමත් සමග ජීවත් වීමේදී මේ විපත්වලටත් මුහුණදීමට සිදුවෙනවා. නමුත් මේ ආපදාවන් හරි හැටි කළමනාකරණය කර ගතහොත් ජීවිත හානි අවම කර ගන්න පුළුවන්. අපේ රටේ ස්වාභාවික විපත්වලින් වුවත් මෙලෙස සිය ගණනින් මිය යන්නේ එබඳු කළමනාකරණ වැඩපිළිවෙළක් නැති නිසාද?**

ජල ගැලීම්, නියඟ, නාය යෑම් සහ සුළි සුළං අපේ රටට බලපාන ස්වාභාවික විපත් කිහිපයක්. සුනාමිය මේ විපත් තරම් බහුලව සිදුවන්නක් නෙවෙයි. නාය යන හැම තැනකම බෑවුම සහ එහි ස්වභාවය, බෑවුමේ ඇති වන වැස්ම සහ බෑවුම මත සිදුවන මිනිසාගේ ක්‍රියාකාරකම් පැහැදිලිවම බලපානවා. ජනගහනය වැඩිවීමත් සමග කඳුකර සහ බෑවුම් සහිත ප්‍රදේශවල වනවැස්මට හානි සිදුවුණා. දර්ශනීය කඳු මුදුන් මත හෝටල් ඉදිවුණා. ස්වභාව ධර්මයේ සිදුවන දීර්ඝකාලීන ක්‍රියාදාමයන් නිසා සිදුවන නාය යෑමේ ක්‍රියාවලිය මිනිසා විසින් වේගවත් කර තිබෙනවා. එම නිසා නාය යෑම්වලට අක්‍රිය ප්‍රදේශත් මිනිසා විසින් සක්‍රිය කර තිබෙනවා.

සංවර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඇති කිරීමට ගෙන ඇති පියවර නිසාත් අපි අද මෙබඳු විපත්වලට අත වනමින් සිටිනවා. හපුතලේ කන්ද දැකලා බඩ දනවා කියමින් එදා අපේ මුතුන් මිත්තෝ හපුතලේ කන්ද නැග්ගත් අද ටොන් ගණන් බර පටවගත්ත කන්ටේනර් හපුතලේ කන්දත් සොලවමින් ඒ කන්ද නගිනවා. මේ දැවැන්ත පාරවල්, ටොන් ගණන් බර වාහන කඳුකර පරිසරයේ ස්වාභාවික රිද්මයට අද විශාල හානියක් කර තිබෙනවා. මේ හානිය කවුරුවත් ගණන් ගන්නේ නෑ.

පසුගිය වසර 10- 15 තුළ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය විශාල පරිශ්‍රමයක් දරල මේ නාය යන ප්‍රදේශවල සිතියම් නිර්මාණය කළා. මේ මේ ප්‍රදේශවල කිසිදු ඉදිකිරීමක් නොකරන ලෙස දැනුම් දුන්නා.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ඇති වුණේ ඊට පස්සේ. ඔය මධ්‍යස්ථාන ඇතිවෙන්න කලින් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මෙබඳු විපත් අවම කර ගැනීම සඳහා විශාල වැඩකොටසක් කරගෙන ආවා. එම වැඩපිළිවෙළ විවිධ ආයතන වෙත බෙදී යෑම නිසා අඩාල වූ බවයි මගේ අදහස.

**ආයතන වැඩිවන විට නායකයෝත් වැඩි වෙනවා. එක නායකයෙක් තව නායකයෙක් කියන දේ පිළිගැනීමට සූදානම් නැති අවස්ථා තිබෙනවා. මේ නිසා ජනතාවත් හරි හැටි දැනුවත් නොවන අවස්ථා තිබෙනවා. නිකම්ම මෙතනින් යන්න කිව්වට ජනතාව යන්න කැමති නෑ. ඇතැම් විට වෙනත් තැනක ඉඩකඩම් දුන්නත් ඔවුන් යළිත් පැරැණි ප්‍රදේශයටම පැමිණෙන අවස්ථා තිබෙනවා.**

ආයතන වැඩිවීම නිසා, නායකයෝ වැඩිවීම නිසා මේ විපත් පිළිබඳ ජනතාව හරි හැටි දැනුවත් කරල ඔවුන් අනතුරුදායක ස්ථානවලින් ඉවත් කිරීමේ ක්‍රියාවලිය හරිහැටි සිදුවන්නේ නෑ. අන්තිමේදී එයට වන්දි ගෙවන්නට සිදුවන්නේත් ජනතාවටමයි. බොහෝවිට වගකිවයුත්තන් කරන්නේ අතුරුදන් වූ ගණන, මියගිය ගණන සහ ලබාදෙන වන්දි මුදල් ප්‍රකාශ කිරීම පමණයි.

රටකට සංවර්ධනය අවශ්‍යයි. නමුත් පරිසරයට හානි සිදුවන ආකාරයට සිදුකරන සංවර්ධනයෙන් රටට සිදුවන්නේ හානියක්. ඇමරිකාවේ සහ ජපානයේ මා කළ සංචාරවලදී ඒ රටවල් තම කඳුකර ප්‍රදේශ ආරක්ෂා කර තිබෙන හැටි මා දුටුවා. නමුත් අපේ කඳුකර ප්‍රදේශ මහා මාර්ග, කර්මාන්ත ශාලා, හෝටල් ආදියෙන් පිරිලා. එහෙමත් නැත්නම් නොයෙක් වගාවන් සඳහා එළිකරලා. ලෝකයේ වෙනත් රටවල මීට වඩා විශාල නාය යෑම් සිදුවුවත් මෙබඳු ජීවිත හානි සිදුවන්නේ නෑ. අපේ රටේ ආපදා කළමනාකරණය කිසිදු පිළිවෙළක් නැති ක්‍රියාදාමයක්.

සන්නස Cartoon by PK




**සියලුම ජෝතිශ්‍ය කටයුතු**

දෙස් විදෙස් ජේන්ද සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සිතුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මගහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දළ, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.wix.com/eppingvic/subodhabeauty
0433536097 subodhaastro@yahoo.com.au